# සංස්කෘතික ආධිපත්‍යය හා දේශපාලනය

බටහිර විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වය සම්බන්ධයෙන් මෙතෙක් සඳහන් කළ දෑ සාරාංශ කරගත යුතු වන්නේ මහාවිහාරයේ ස්වාධීනත්වය අපට ඒ සමග සංසන්දනය කළ හැකි බැවිනි. බටහිර විශ්වවිද්‍යාල මධ්‍යකාලීන යුරෝපීය කතෝලික සංස්කෘතියෙහි කතෝලික චින්තනයෙහි නිර්මාණය වූ ආයතන විය. ඒ ආයතනවලට නිදහසක් තිබුණේ කතෝලික චින්තනයට පිටු නොපාන තෙක් පමණ ය. එහෙත් ගැලීලියෝ වැනි විද්වතුන් කතෝලික චින්තනයෙන් මිදෙත් ම එවැනි විද්වතුන්ට හා විශ්වවිද්‍යාලවලට ප්‍රශ්න ඇති විය. ගැලීලියෝ වැනි විද්වත්තු ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පෝෂණය කළහ. ඉතාලියේ දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට විරුද්ධ වූ බැවින් තවදුරටත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එහි විශ්වවිද්‍යාලවල ඉඩක් නො වී ය.

ඉන්පසු විශ්වවිද්‍යාල වර්ධනය වූයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට තෝතැන්නක් වූ එංගලන්තයෙහි ය. එංගලන්තයේ ද ඔක්ස්ෆර්ඩ් කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල බිහිවූයේ මධ්‍යකාලීන කතෝලික චින්තනයෙහි ය. ඒ විශ්වවිද්‍යාලවලට කතෝලික ධනවතුන් විසින් ධනය හා දේපොළ ප්‍රදානය කර තිබුණ ද, එංගලන්තයේ සිදු වූ දේශපාලන හා සංස්කෘතික වෙනස්කම් අනුව ඒ රදළ ප්‍රභූ එක්කෝ නූතනත්වයේ ධනපතියන් බවට පත්වූහ. නැතහොත් දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය ඔවුන් අතින් ගිලිහිණි.

එංගලන්තයේ විශ්වවිද්‍යාලවලට ද තම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ක්‍රියාකරන තාක් යම් ස්වාධීනත්වයක් හිමිවිණි. මේ ස්වාධීනත්වය අභියෝගයට ලක්නොවූයේ මූලික වශයෙන් ම එංගලන්තයේ විශ්වවිද්‍යාල ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට එරෙහිව නොගිය බැවිනි. එමෙන් ම මධ්‍යකාලීන ධනවතුන්ගෙන් ලත් පරිත්‍යාග ද ඒ විශ්වවිද්‍යාල සතුවිය. ඒ මධ්‍යකාලින ධනවතුන්ගෙන් පැවත එන්නන් එක්කෝ නව බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියට ඇතුළත් ව සිටි බැවින් හෝ දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යයෙන් පිරිහී සිටි බැවින් හෝ ඔවුන්ට විශ්වවිද්‍යාල ස්වාධීනත්වයට ඇඟිලි ගැසීමට නො හැකි විය.

බටහිර විශ්වවිද්‍යාලවලින් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට අභියෝගයක් එල්ලවූයේ ජර්මනියෙන් ය. ඒ ක්වොන්ටම් භෞතිකය ඔස්සේ ය. ඒ අභියෝගයට වසර සියයක් පිරී ඇති මුත් එය ජයග්‍රහණයක් කරා ගොස් නැත. අද ඒ අභියෝගය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ම මෙල්ල කිරීමට ඇංග්ලො සැක්සන් සංස්කෘතියට අයත් එංගලන්තය හා ඇමරිකාව ප්‍රධාන රටවල් උත්සාහ කරනු දැකිය හැකි ය.

විශේෂයෙන් ම ඇමරිකාව එවැනි උත්සාහයක් දැරීමට අමතර ව විශ්වවිද්‍යාල ද මෙල්ල කිරීමට ද කටයුතු කරනු දැකිය හැකි ය. මෙතෙක් බටහිර විශ්වවිද්‍යාලවලට ඒ ඒ සංස්කෘතියෙහි හා චින්තනයෙහි ක්‍රියාත්මක වන තාක් කල් යම් ස්වාධීනත්වයක් තිබුණි. එහෙත් දැන් දැන් ඒ ස්වාධීනත්වය ද නැතිවනු දැකිය හැකි ය. අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආකල්පවලට අනුව යමින් ඇමරිකාව ප්‍රධාන අනෙක් බටහිර රටවල් තමන් විශ්වවිද්‍යාලවලට ආයෝජනය කරන ධනයට ප්‍රතිලාභයක් සෘජුව ම බලාපොරොත්තු වෙයි. කලින් ඒ ප්‍රතිලාභ ලැබුණේ වක්‍ර ව හා යම් කාලයකට පසුව ය. එහෙත් අද ආයෝජකයෝ  එසේ නො ඉවසති.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එවැනි ඉවසීමක් නෛසර්ගික ව උරුම වී නැත. කලින් යම් ඉවසීමක් තිබුණි නම් ඒ කතෝලික චින්තනයෙන් ලැබුණු දෙයක් විය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය බලවත් වීමත් සමඟ ඒ ඉවසීම පළා ගොස් ඇත. අද බටහිර විශ්වවිද්‍යාල ද ඉක්මණින් ධනය ඉපයීමේ මාවත් දෙසට ඇදෙනු දැකිය හැකි ය. දැනුම නිර්මාණය ද ආයෝජනය හා ප්‍රතිලාභය සමග ගැට ගැසී ඇත. ලංකාවේ විශ්වවිද්‍යාලවල සංකල්ප, ප්‍රවාද ආදිය නිර්මාණය නොවන නමුත් එහි ද අනුන්ගේ දැනුම හෝ විකුණා මුදල් ඉපයීමට නැඹුරුවක් තිබෙනු දැකිය හැකි ය.

කලින් සඳහන් කළ පරිදි ඇමරිකාවේ පර්යේෂණ කටයුතු සඳහා හමුදාව ද ධන ආයෝජනය කරයි. හමුදාවට ඇත්තේ ඉතා කෙටිකාලීන බලාපොරොත්තු ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් හිමි වූ නොඉවසීම සමග ඒ බලාපොරොත්තු තව තවත් කෙටිකාලීන වෙයි. අද හමුදාව ද පර්යේෂණ සඳහා ප්‍රතිපාදන ලබාදෙන ආයතන ද බටහිර ඊනියා

© Prof. Nalin De Silva

පර්යේෂණ විශ්වවිද්‍යාලවල (research universities) ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වනුයේ හැකිතාක් පර්යේෂණ පත්‍රිකා (research papers) පළ කිරීම ය. පර්යේෂණ පත්‍රිකා පළ නොකිරීම ඔවුන්ගේ රැකියා පවත්වාගෙන යෑමට තර්ජනයක් වෙයි. පෙර මෙන් නොව පර්යේෂණ සඳහා විශාල මුදලක් අවශ්‍ය බැවින් හමුදාව හා අනෙක් ආයතන මගින් විශ්වවිද්‍යාලයීය පර්යේෂණ පාලනය කෙරෙයි. ඒ සමග විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වය ද නැති වෙයි.

ඒ අතර මධ්‍යකාලීන විශ්වවිද්‍යාලවල තිබූ අනුකලිත අධ්‍යාපනය ද අද බටහිර විශ්වවිද්‍යාලවලින් ඉවත් වීගෙන යයි. අනුකලිත අධ්‍යාපනය කතෝලික චින්තනයේ ප්‍රතිඵලයකි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පදනමෙහි ම වෙන්කිරීම ඇත. මේ වෙන්කිරීම හේතුවෙන් දැනට අවුරුදු සියයක පමණ කාලයක පීඨ අනෙක් පීඨවලින් ද, අධ්‍යාන අංශ අනෙක් අධ්‍යයන අංශවලින් ද ක්‍රමයෙන් වෙන් වෙමින් ඇත.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වී ඇත්තේ අද බටහිර විශ්වවිද්‍යාල මධ්‍යකාලීන විශ්වවිද්‍යාල සමඟ සංසන්දනය කිරීමේ දී තවදුරටත් විශ්වවිද්‍යාල නොවන බව ය. ලංකාවේ විශ්වවිද්‍යාල ගැන කතාකිරීමෙන් වැඩක් නැත. අප කර ඇත්තේ බටහිර විශ්වවිද්‍යාල අනුකරණය කිරීම පමණ ය. මෙරට විශ්වවිද්‍යාලවලට බටහිර විශ්වවිද්‍යාලවලට පමණවත් ස්වාධීනත්වයක් නැතිවීම කණගාටුදායක වන්නේ විශේෂයෙන් ම අපේ පැරණිම විශ්වවිද්‍යාලය වූ මහාවිහාරය සමග සංසන්දනය කිරීමේ දී ය.

විශ්වවිද්‍යාල ස්වාධීනත්වය අවසාන විග්‍රහයේ දී සංස්කෘතික ස්වාධීනත්වය සමග බැඳී ඇත. බටහිර කතෝලික චින්තනයෙහි වුව ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි වුව ද, දේශපාලන ආධිපත්‍ය හා සංස්කෘතික ආධිපත්‍යය එකිනෙකින් ස්වායත්ත නො වෙයි. මධ්‍යකාලීන යුරෝපයෙහි දේශපාලන ආධිපත්‍යය සංස්කෘතික ආධිපත්‍යයට යටවිය. පාප් වහන්සේ කතෝලික ආගමේ නායකයා පමණක් නො වී ය. එතුමා කතෝලික සංස්කෘතියෙහි ද කතෝලික චින්තනයෙහි ද නායකයා විය. එපමණක් නොව දේශපාලන නායකත්වය ද එතුමා සතු විය. මෙහි දී අප සිහි තබාගත යුතු වැදගත් කරුණ නම් දේශපාලන නායකත්වය සංස්කෘතික නායකත්වයට යටවීම ය.

ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි සිදු වී ඇත්තේ මෙහි අනෙක් පැත්ත ය. මේ චින්තනයෙහි ආරම්භය පහළොස්වැනි සියවසරේ ඉතාලියේ දැකිය හැකි නමුත් එය පල ගැනුණේ එංගලන්තයෙහි ය. අටවැනි හෙන්රි රජු පාප්වහන්සේගෙන් නිදහස් වී ඇංග්ලිකන් ක්‍රිස්තියානිය ඇරඹීමත් සමග දේශපාලන ආධිපත්‍යය විසින් සංස්කෘතික ආධිපත්‍යය යටකර ගනු ලැබිණි.

ඉන් පසුව ඇංග්ලිකන් ක්‍රිස්තියානියේ හෙවත් එංගලන්ත සභාවේ නායකයා වූයේ එංගලන්තයේ (බ්‍රිතානියේ) රජු ය. නැතහොත් රැජින ය. එංගලන්තයේ රජු එංගලන්ත සභාවේ ද නායකයා ය. ඔහු ඇංග්ලිකන් ක්‍රිස්තියානියේ ආරක්ෂකයා ය (defender of the faith). එංගලන්ත සභාවේ ප්‍රධාන පූජකවරයා වූ කැන්ටබරියේ ආච් බිෂොප්තුමාට දේශපාලන ආධිපත්‍යය නොව අඩුම තරමින් තම ආගමේ නායකත්වය ද නැත. ආච් බිෂොප්තුමා දේශපාලන වශයෙන් පමණක් නොව ආගමික හා සංස්කෘතික වශයෙන් ද එංගලන්තයේ රජුට හෝ රැජිනට හෝ යටත් වෙයි.

එංගලන්තයේ රජු හෝ පසු කලෙක පාර්ලිමේන්තුව හෝ අනාගමික නො වෙයි. අද බටහිර දේශපාලන විද්‍යාඥයන් පෙන්වීමට උත්සාහ කරන්නේ එංගලන්තයේ හා අනෙක් බටහිර රටවල අනාගමික රාජ්‍ය ඇති බව ය. එහෙත් ඒ එසේ නො වේ. පාප් වහන්සේගේ ආධිපත්‍යය නැතිකිරීම නිසා රාජ්‍යයට අනාගමික බවක් අත් නො වෙයි. පාප් වහන්සේගේ ආධිපත්‍යය නැතිකිරීමෙන් සිදු වූයේ ආගමික ආධිපත්‍යය නැතිකිරීම නො වෙයි. එහි දී සිදු වූයේ සංස්කෘතික ආධිපත්‍යයට යට වී තිබූ දේශපාලන ආධිපත්‍යය විසින් සංස්කෘතික ආධිපත්‍යය යටකරනු ලැබීම ය.

ඒ ක්‍රියාව ඉතා වැදගත් නිසා අපි එය තවදුරටත් විභාග කරමු. මධ්‍යකාලීන කතෝලික යුරෝපයේ දේශපාලන ආධිපත්‍යය මෙන් ම සංස්කෘතික ආධිපත්‍යය ද එක් පුද්ගලයකු සතු විය. ඒ පාප් වහන්සේ ය. එංගලන්තයේ ද දේශපාලන ආධිපත්‍යය හා සංස්කෘතික ආධිපත්‍යය එක් පුද්ගලයකු සතු විය. ඒ රජු ය. මෙහි දී ඇති වූ වෙනස ඒ

© Prof. Nalin De Silva

තනි පුද්ගලයා සම්බන්ධයෙන් නො වී ය. අවස්ථා දෙකෙහි ම නායකත්වය දැරුවේ එක් පුද්ගලයෙකි. එසේ වුවත් පාප් වහන්සේ සම්බන්ධයෙන් ගත්කල දේශපාලන ආධිපත්‍යය සංස්කෘතික ආධිපත්‍යයට යට විය. එංගලන්තයේ රජු සම්බන්ධයෙන් ගත්කල සංස්කෘතික ආධිපත්‍යය දේශපාලන ආධිපත්‍යයට යටවිය.

ආගමක් නිසා සංස්කෘතියක් ඇති වනු නොව සංස්කෘතියක් නිසා ආගමක් ඇතිවන්නේ යැයි අපි කියා ඇත්තෙමු. බටහිර දේශපාලන විද්‍යාඥයන් බටහිර රටවල් අනාගමික යැයි කියන්නේ මේ සංස්කෘතික සාධකය අමතක කිරීමෙනි. බටහිර කිසිම රටක් අනාගමික නොවන්නේ ඒ සෑම රටක ම අධිපතිවාදී සංස්කෘතියක් ඇති බැවින් හා ඒ සංස්කෘතිය විසින් ජනිත කෙරුණු ආගමක් හෝ ආගම් හෝ ඇති බැවිනි. බටහිර ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියකි. ඒ සංස්කෘතියෙහි ඇංග්ලිකන් සභාව, මෙතෝදිස්ත සභාව, රෙපරමාදු ක්‍රිස්තියානිය ආදී විවිධ ක්‍රිස්තියානි ආගම් වෙයි. ඒ ඒ රාජ්‍යයෙහි ඒ ඒ ආගම ප්‍රධාන වෙයි. රාජ්‍යයක් අධිපතිවාදී සංස්කෘතියකින් වියෝ නො වෙයි.

අද ඇතැමුන් බරක් ඔබාමා මහතා ගැන කතාකරන්නේ ඇමරිකාවේ උපන් කළු ජාතිකයකු ලෙස සලකමිනි. ඔහුගේ පියා ඉස්ලාම් ආගමිකයකු වුවත් ඔහු හැදී වැඩී ඇත්තේ ඔහුගේ සුදු මවගේ සංස්කෘතියෙහි හා ආගමෙහි ය. අද ඇමරිකාවේ ඉහළ සමාජයෙහි සුදු කළු භේදයක් නැත. එහෙත් එපමණකින් එහි සංස්කෘතික භේදයක් නැතැයි සිතිය නො යුතු ය. ඔබාමා මහතා සංස්කෘතික වශයෙන් ඇමරිකන් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් ය. ඔහුට අද එහි පිළිගැනීමක් ඇත්තේ ඒ නිසා ය. යම් අයුරකින් ඔහු මුස්ලිම් සංස්කෘතියට අයත් වී නම්, ඔහු ආගමින් ඉස්ලාම් වී නම් ඔහුට කුමක් සිදු වීමට තිබුණි ද? කිසිදු සැකයකින් තොරව ඔහුට ඩිමොක්‍රටික් පක්ෂයෙහි අපේක්ෂකත්වය හිමි නොවනු ඇත. අදත් ඇතැම් ඇමරිකානුවන්ට ඔබාමා මහතාගේ  සංස්කෘතිය ගැන ප්‍රශ්න ඇත. ඇමරිකාවේ ඇතැම් රූපවාහිනී නාලිකා  ඔබාමා මහතා ගැන සඳහන් කරන විට බරක් හුසේන් ඔබාමා යටනුවෙන් පවසමින් හුසේන් යන මුස්ලිම් නම අවධාරණය කටන්නේ සංස්කෘතික සාධකයෙහි ඇති වැදගත්කම හේතුකොට ගෙන ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva